**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492**

**ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்ற வெளியீட்டு தொடர் இலக்கம் : 492**

**நிறுவனத்தின் பெயர் : மாவட்ட செயலகம் - புத்தளம்**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Series No:492**

**Name of the Institution: District Secretariat - Puttalam**

Submission of observations of Hon. Minister in charge of the Institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119 (4).

**අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට අදාළ රාජ්‍ය ගිණුම් පිළිබඳව කමිටුව මගින් පාර්ලිමේන්තුව මගින් ඉදිරිපත්කරන වාර්තා සම්බන්ධයෙන් ආයතනභාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගන්නා පියවර ඉදිරිපත් කිරීම-**

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලා අංක :- 492
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :- පුත්තලම

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මහපෙන්වීම් | වර්තමාන ප්‍රගතිය |
|---|---|
| පළමු කොටස - | |
| 1. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත්කිරීමේදි. මසක් තුල පිළිතුරු සැපයීමට ප්‍රායෝගිකව අපහසුවන අවස්ථා පවති.එවැනි අවස්ථාවල අතුරු පිළිතුරක් යොමු කරනු ලැබේ. |
| 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විගණන කමිටුව අවම වශයෙන් හෝ රැස්ව නැත | යම් යම් හේතු නිසා රැස්වීම් පැවැත්වීමට බාධා සිදු වී ඇති අතර, 2026 වසරේ හැකිතාක් එකී ගැටළුව අවම කර ගනිමින්, මේ වන විට විගණන කමිටු රැස්වීම් 19ක් පැවැත්වීමට කටයුතු කර ඇත. |
| 3. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිලිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුනි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාල වකවානුව (ජුනි 15) තුල ක්‍රියාත්මක කර ඇත. (2025/06/11) |
| 4. වාහනයක් ගරහිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි. | ඉදිරියේ දී නියමිත කාල පරිච්ඡේදය තුළ අපහරණ ක්‍රියාව සිදු කිරීමට උපදෙස් ලබා දීමට සහ පසුවිපරම් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| 5. වර්ෂයකට වඩා වැඩිකාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුනි. | වර්ෂ 10-20 අතර පවතින ණය ශේෂ සම්බන්ධයෙන් ණය කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර අනෙකුත් ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදු කරමින් පවතී. |
| 6. පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රජයේ නිවාස ඇප තැන්පත්/ තඩු හේතුවෙන් (දි.ලේ.කා- රු.540,000/- , ප්‍රා.ලේ.කා මුන්දලම රු.17,100/- හා රු.15,495/- ) සහ ඉඩම් තැන්පතු හැර අනෙකුත් වසර 02ට වැඩි සියළුම තැන්පතු මු.රෙ.571 අනුව කටයුතු කිරීම කර ඇත. |
| දෙවැනි කොටස- | |
| 1. මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | කමිටුව වෙන් කර ඇති දිනයන් වලදී පවත්වා ඇති අතර ඉදිරියේදී ද වෙන් කර ඇති දිනයන් වලදි පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |
| 2. දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලීම් කර ඇති අවස්ථාවලදි පමණක් රැස්වීම් පවත්වා ඇති අතර ඉදිරියේදීද එම ඉල්ලීම් අනුව රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |
| 3. දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | මෙම කමිටුව පවත්වන්නේ කන්නයකට එකක් බැගින් කන්න දෙකට 02 ක් පවත්වා ඇත. ඉදිරියේදීද එපරිදිම පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| 4. දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | මෙම කමිටුව අවුරුද්දේ මාස 06 කට වරක් පවත්වන බැවින් අවුරුද්දට දෙපාරක් පවත්වා ඇත. ඉදිරියේදී ද එපරිදිම පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |
| 5. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය. | ඉදිරියේ දී පිරිසිදු විගණන මතයක් ලබාගැනීම සඳහා හැකි සියළුම ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 6. දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි. | කාර්තුවකට 01 බැගින් රැස්වීම පවත්වා නොමැති නමුත් ඉදිරිපත් වන ගැටළු සාකච්ඡා කර විසඳුම් ලබා දි ඇත. |
| 7. ළමා අයිතිවාසිකම් පිළිබඳව දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි. | කාර්තුවකට 01 බැගින් රැස්වීම පවත්වා නොමැති නමුත් ඉදිරිපත් වන ගැටළු සාකච්ඡා කර විසඳුම් ලබා දි ඇත. |
| 8. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දි තිබු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි | රාජ්‍ය වියදම් කලමනාකරණය යටතේ 2023 වර්ෂයේ ලැබි ඇති ප්‍රතිපාදන මත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පුහුණු පමණක් ලබා දීමට කටයුතු කරන ලදි. |
| 9. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණකාධිපති වාර්තාවේ නිර්දේශයන්ට අදාල පිළිතුරු සපයා ඇති අතර, පිළිතුරෙහි සඳහන් පරිදි අවශ්‍ය පියවර ගෙන ඇත. |
| 10. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරින් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ස්ථාන මාරු වීම් යටතේ නිලධාරීන් විසින් කළ ඉල්ලීම් අනුව ලැබී ඇති සියලු ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම වසර 05 ඉක්මවා ඇති නිලධාරීන් පිළිබඳ තොරතුරු වාර්ෂිකව පත්වීම් බලධාරි වෙත යොමු කිරීමට ද කටයුතු කර ඇත. |

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පුත්තලම

වයි.අයි.එම්. සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය

ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පුත්තලම

ඒ.එම්.ඩබ්.කේ. ප්‍රසන්න
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පුත්තලම

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.